ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2021 - 11 - 12

පැමිණිලි පාර්ශවය : එච්.ඩී ප්‍රේමරත්න මයා,
නො : 56, පළවන මාවත,
අම්පාර.

වගඋත්තර පාර්ශවය : 01. ලේකම්,
පළාත් අධ්‍යාපන අමාත්‍යංශය,
නැගෙනහිර පළාත,
ත්‍රිකුණාමලය.

02. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන කාර්යාලය,
අම්පාර.

තෙවන පාර්ශවය : 01. ලේකම්,
පාසල් සංවර්ධන කමිටුව,
අම්/කාවන්තිස්ස විද්‍යාලය,
අම්පාර.

02. ලේකම්,
ආදිශිෂ්‍ය සංගමය,
අම්/ කාවන්තිස්ස විද්‍යාලය,
අම්පාර.

පැමිණිලි අංකය : **HRC/AM/70/16**

**පැමිණිල්ලේ කරුණු :-**

පැමිණිලිකරු විසින් 2016.06.09 වන දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත සිය පැමිණිල්ල ගොනුකරමින් සඳහන් කර ඇත්තේ, 2016.06.10 වන දිනට ක්‍රියාත්මක වන ලෙස වගඋත්තර පාර්ශවය විසින් තමාට ලබා දී ඇති ස්ථාන මාරුව හේතුවෙන් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ

බවයි. එරෙහිව මෙම පැමිණිල්ල ගොනුකර ඇත. පැමිණිලිකරු 2012.07.05 දින සිට 1-සී පාසලක් වන අම්/කාවන්තිස්ස විද්‍යාලයේ විදුහල්පති ලෙස පත්කර ඇති බවත්, පළාත් අධ්‍යාපන ලේකම්ගේ නිර්දේශ පරිදි විධිමත් ලෙස එකී පත්වීම ලද බවත්, දැනට අම්/කවන්තිස්ස විද්‍යාලයේ සේවා කාලය වසර 04 ටත් අඩු බවත්, එසේ තිබියදී තවත් 1-සී පාසලක් වන අම්/පරගහකැලේ විද්‍යාලයට ස්ථාන මාරු කර ඇති බවත් සඳහන් කර ඇත. තමන් අම්/කාවන්තිස්ස විද්‍යාලයේ වැඩ භාරගැනීමට පෙර එම පාසල අරාජික තත්වයකින් පැවැති බවත්, එවකට එම පාසල භාරගැනීම සඳහා වෙනත් විදුහල්පතිවරුන් ඉදිරිපත් නොවූ බවත්, ඒ අනුව තමන් විසින් පාසලේ සංවර්ධන කටයුතු ඉහළ මට්ටමකට ගෙන එමින් විභාග ප්‍රතිඵලද ඉහළ මට්ටමකට ගෙන ආ බවත්, එමෙන්ම 2016.02.09 දිනැතිව විදුහල්පති පුරප්පාඩු පවතින පාසල් නම් කිරීමේදී කාවන්තිස්ස විද්‍යාලය විදුහල්පති පුරප්පාඩු පවතින විදුහලක් ලෙස නම් කර නොමැති බවත්, එසේ තිබියදී මෙම ස්ථාන මාරුව කර ඇති බවත් සඳහන් කර ඇත. ඒ සම්බන්ධයෙන් තමන් විසින් කරන ලද අභියාචනය සලකා බලන තෙක් අම්/කාවන්තිස්ස විද්‍යාලයේ සේවය කිරීමට ඉඩ සලස්වා දෙන ලෙසට මෙම පැමිණිල්ලෙන් ඉල්ලා ඇත.

පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, අදාළ ස්ථාන මාරුව කිසියම් පිරිසකගේ දේශපාලන අවශ්‍යතාවයක් මත වගඋත්තර පාර්ශවීය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදුකර ඇති බව පැහැදිලි වන බවත්, ඒ අනුව ස්ථාන මාරුව පදනම් විරහිත බවත්, මේ නිසා තමන්ගේ මූලික අයිතිවාසිකම් කඩ වූ බවට තීන්දුවක් ලබාදෙන ලෙසත් ස්ථාන මාරුව අවලංගු කරදෙන ලෙසත් ඉල්ලා සිටී.

**වගඋත්තර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු :-**

පැමිණිල්ලට අදාළ මූලික පරික්ෂණය සඳහා පළවන වගඋත්තර පාර්ශවීය අධ්‍යාපන සහකාර ලේකම් වාචිකව කරුණු ඉදිරිපත් කර ඇති අතර, 2016.07.22 දිනැතිව කරන ලද අවසන් පරීක්ෂණයේදී 1 සහ 2 වගඋත්තරකරුවන් වාචික කරුණු දැක්වීමක් සිදුකර ඇත. මූලික පරික්ෂණයේදී කොමිෂන් සභාව විසින් කරන ලද කරුණු විමසීමට අදාළව කරුණු 11 ක් යටතේ 2 වන වගඋත්තර පාර්ශවීය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් 2016.07.27 වන දින ලිඛිත කරුණු ගොනුකර ඇත.

ඒ අනුව වගඋත්තර පාර්ශවයන් විසින් පැමිණිල්ලේ කරුණු සම්බන්ධයෙන් සෘජුවම ලිඛිත කරුණු ගොනු කිරිමක් සිදුකර නැත.

දෙවන වගඋත්තර පාර්ශවීය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ පැමිණිලිකරුගේ ස්ථාන මාරුව පළවන වගඋත්තර පාර්ශවීය අධ්‍යාපන ලේකම්වරයාගේ ලිඛිත උපදෙස් මත සිදුකළ බවයි. 2016 විදුහල්පති ස්ථාන මාරු යටතේ පළවන වගඋත්තරකාර අධ්‍යාපන ලේකම් විසින් අදාළ ස්ථාන මාරු අනුමත කර ඇති බවත් එම මාරුවීම් වසර මැද අනුමත වූ

හෙයින් එකී මාරුවීම් කළ බවත්, විදුහල්පතිවරුන් මාරුකිරීමේ චක්‍රලේඛය පිළිබඳව අවධානය යොමුකර නැති බවත්ය.

පළවන වගඋත්තර පාර්ශවීය අධ්‍යාපන ලේකම් වෙනුවෙන් කරුණු දක්වමින් සහකාර ලේකම් අවධාරණය කර ඇත්තේ, 2016.06.01 දිනැතිව දෙවන වගඋත්තරකාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කරන ලද නිර්දේශ අනුව මාරුවීම් අනුමත කර එය ක්‍රියාත්මක කරන ලෙසට වගඋත්තරකාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත 2016.06.01 දින උපදෙස් ලිඛිතව ලබා දුන් බවයි. මාරුවීම් ලේඛනයේ ඇතැම් විදුහල්පතිවරුන්ගේ ස්ථාන මාරුවීම් යම් යම් හේතූන් මත ක්‍රියාත්මක නොකළ බවද පළවන වගඋත්තරකාර අධ්‍යාපන ලේකම් දන්වා ඇත.

**තෙවන පාර්ශවයේ කරුණු දැක්වීම :-**

තෙවන පාර්ශවීය ලේකම්, පාසල් සංවර්ධන සමිතිය හා ලේකම්, ආදි ශිෂ්‍ය සංගමය පරීක්ෂණ අවස්ථා වල මෙන්ම ඉන් පෙර හා පසුවද ලිඛිතවද කරුණු ඉදිරිපත් කර ඇත. තෙවන පාර්ශවය සඳහන් කර ඇත්තේ පැමිණිලිකරුට ලබා දී ඇති ස්ථාන මාරුව නීති විරෝධී බවත් වසර 4 ක් යන්නටත් පෙරම ස්ථාන මාරුකිරීම හා පාසල ඉතා හොඳින් දියුණුවට පත්කරමින් සිටියදී විදුහල්පතිවරයා හදිසියේ මාරු කිරීමෙන් පාසලේ සංවර්ධනය බිඳ වැටෙන බවත්, එය කෙලින්ම දරුවන්ගේ අධ්‍යාපනයට බලපාන බවත්, විශේෂයෙන්ම වසර මැද විදුහල්පතිවරයා මාරුකිරීමෙන් පාසලේ අධ්‍යාපන සැළැස්ම බිඳ වැටීමෙන් තමන්ගේ දරුවන්ගේ විභාග වලට එය බලපාන බවත්ය. එසේම විදුහල්පති මාරු කිරීමේ චක්‍රලේඛ උල්ලංඝනය කිරීම පළවන ශ්‍රේණියේ විදුහල්පතිවරු ස්ථානගත කිරීමේ හා පුරප්පාඩු පවතින පාසල් සඳහා විදුහල්පතිවරුන් පත්කිරීම, වසර 5 ට වැඩි විදුහල්පතිවරු මාරු කිරීම යන ක්‍රියාවලිය ඉතාම අවිධිමත් එකක් බවත්, එමඟින් පාසල් පද්ධතිය බිඳ වැටෙන බව ඔවුන්ගේ ස්ථාවරය බවත්, එමඟින් දෙමාපියන් විසින් එයට එරෙහිව ක්‍රියාමාර්ග ගත් බවත් එය දරුවන්ගේ යහපත සඳහා ගන්නා ක්‍රියාමාර්ග බවත් තෙවන පාර්ශවයේ ස්ථාවරය ලෙසට දක්වා ඇත.

**විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලිකරු 2012.07.05 වන දින සිට අම්/කාවන්තිස්ස විද්‍යාලයේ විදුහල්පති ලෙස පත්කර ඇති අතර අයදුම්පත් කැඳවා විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් පසුව 2012.06.25 දිනැතිව පූර්වගාමී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ පත්වීම ලබා දී ඇත. ඒ අනුව අම්/කාවන්තිස්ස විද්‍යාලයේ සේවාකාලය වසර 4 ක් හෝ සම්පූර්ණ වී නොමැති බව අනාවරණය වේ.

පැමිණිලිකරු ස්ථාන මාරු කර ඇත්තේද 1-සී කාණ්ඩයේ පාසලකට වන අතර, 1-සී කාණ්ඩයේ ප්‍රධාන පාසල් කිහිපයකම විදුහල්පති II ශ්‍රේණියේ විදුහල්පතිවරුන් විදුහල්පති තනතුර දරන බැවින් එම

කාණ්ඩයේ පාසල් වල විදුහල්පති තනතුරු දැරීම සඳහා විදුහල්පති II ශ්‍රේණියේ විදුහල්පතිවරුන්ට නීතිමය බාධාවක් නොමැති බව අනාවරණය වේ.

වගඋත්තර පාර්ශවය සඳහන් කරන පරිදි පැමිණිලිකරු ඇතුළු තවත් විදුහල්පතිවරුන් කණ්ඩායමක් ස්ථාන මාරු කරන්නේ ඒ පිළිබඳව වූ ක්‍රියාදාමයක ප්‍රතිඵලයක් වශයෙනි. අම්පාර කලාපයේ විදුහල්පතිවරුන් මාරු කිරීමේ ලේඛනය නිර්දේශ සහිතව දෙවන වගඋත්තර පාර්ශවීය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සකස් කර අධ්‍යාපන ලේකම් වෙත යොමුකර ඇති බව අනාවරණය වේ.

ඒ අනුව අම්පාර කලාපයේ විදුහල්පති මාරු ලේඛනය සකස් කර ඇති අතර, එකී ලේඛනයට පැමිණිලිකාර විදුහල්පතිවරයාගේ නමද අම්/කාවන්තිස්ස විද්‍යාලයට මාරුවීම් ලැබූ බී.ආර් අබේරත්න මහතා ඇතුළු 21 දෙනකුගේ නම් ඇතුළත් වී ඇති අතර එය ගුරු සංගම් ඇතුළු මාරු මණ්ඩලයක් විසින් සකස් කර ඇති බව අනාවරණය වේ.

ඒ අනුව අධ්‍යාපන ලේකම් විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත 2016.06.01 දිනැතිව පැමිණිලිකරු ඇතුළු තවත් 4 දෙනකුගේ මාරුවීම් අනුමත කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත එවා ඇති අතර, එකී මාරුවීම් ලේඛනයේ නම් සඳහන් පැමිණිලිකරු ඇතුළු විදුහල්පතිවරුන් 5 දෙනකුගෙන් දෙදෙනකු වසර 5 ක් සම්පූර්ණ වීම නිසා ස්ථාන මාරු ලැබූ අය වේ. එක් අයකු නියෝජ්‍ය විදුහල්පතිවරයෙකු වන අතර එක් අයකු I ශ්‍රේණියේ විදුහල්පතිවරයෙකු වේ. ඔහු හැර සෙසු සියලු දෙනාම විදුහල්පති II ශ්‍රේණියේ විදුහල්පතිවරුන්ය. එකී ලේඛනයේ කේ.වී විජේසිංහ යන අයගේ ස්ථාන මාරුව ක්‍රියාත්මක කර නොමැති අතර, ඔහු මීට පෙර විදුහල්පති තනතුරක් දරා නොමැති බවත්, ඔහු සම්මුඛ පරීක්ෂණයට යටත් කොට පත්වීම් ප්‍රධානය පමා කොට ඇති බවත් අනාවරණය වේ.

ඒ අනුව අධ්‍යාපන ලේකම්ගේ 2016.06.01 දිනැති ලිපියෙන් වසර 05 කට වැඩි විදුහල්පති ස්ථාන මාරු සිදුකිරීමත්, I වන ශ්‍රේණියේ විදුහල්පතිවරුන්ට සුදුසු පාසල් ලබා දීමත් සහ 2016 වසරේ ස්ථාන මාරු කිරීම හා නව විදුහල්පති තනතුර ලබා දීම ඇතුළු අවිධිමත් කාර්යයන් කිහිපයක් සිදුකර ඇති බව අනාවරණය වන අතර එම හේතුවෙන් ගැටළු රාශියක් නිර්මාණය වී ඇති බවද අනාවරණය වේ.

සේවා කාලය වසර 05 ට වැඩි විදුහල්පතිවරුන් ස්ථානගත කිරීම සම්බන්ධව 2014.01.06 වන දින පූර්වගාමී අධ්‍යාපන ලේකම්වරයා උපදෙස් ලබා දී ඇති අතර, සේවා කාලය වසර 05 ට අඩු අය මාරුවීම් ලේඛනයට ඇතුළත් කිරීම පිළිබඳවද 02 වගඋත්තරකාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගෙන් විමසා ඇති බව අනාවරණය වේ. 1 AB හා 1 C පාසල් සඳහා විදුහල්පතිවරු පත්කිරීමේ බලයද අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සතුවන බවද එකී ලිපියේ දන්වා ඇත. ඒ අනුව සේවා කාලය වසර 05 ට වැඩි විදුහල්පතිවරුන් මාරු කිරීම වෙනම ක්‍රියාදාමයක් වන අතර වගඋත්තර පාර්ශවය දක්වන පරිදි 01 වන වගඋත්තර අධ්‍යාපන ලේකම්වරයාගේ අනුමැතිය පරිදි පැමිණිලිකරුද

එම ලේඛනයට ඇතුළත් කිරීම නිවැරදි නොවේ. (පැමිණිලිකරුගේ සේවා කාලය වසර 05 ක් සම්පූර්ණ නොවීම හේතුවෙන්) ඒ අනුව ස්ථාන මාරුව ක්‍රියාත්මක කිරීමේදී 01වන 02 වන වගඋත්තර පාර්ශවයන් විසින් පැමිණිලිකරුගේ සේවා කාලය සැළකිල්ලට ගෙන නොමැති බව අනාවරණය වේ.

වසර 05 කට වැඩි සේවා කාලයක් ඇති විදුහල්පතිවරුන්ගේ නාම ලේඛනයක් සකස් කොට ඔවුන් ස්ථාන මාරුකිරීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතියක් ලබාගෙන නොමැති බවද අනාවරණය වේ.

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලබාදුන් නිලධාරීන් ස්ථානගත කිරීම සම්බන්ධව 2015.05.07 වන දින කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් තොරතුරු විමසා ඇති අතර, ඒ සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් I ශ්‍රේණියේ විදුහල්පතිවරුන් තිදෙනෙකුගේ නම් 2015 දෙසැම්බර් මස ඉදිරිපත් කර ඇත. ඔවුන් සම්මුඛ පරීක්ෂණයට ලක්කොට සුදුසු පාසල් ලබාදෙන ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ අධ්‍යාපන ලේකම් වෙතින් ඉල්ලා ඇති නමුත් ඒ සඳහා කිසිදු සම්මුඛ පරීක්ෂණයක් අධ්‍යාපන ලේකම් විසින් පවත්වා නොමැති අතර, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ 2016.07.22 දිනැතිව 2016.07.27 වන දින කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති වාර්තාවේ දක්වා ඇත්තේ 2016.05.05 හා 2016.06.01 දිනැතිව අධ්‍යාපන ලේකම් විසින් I ශ්‍රේණියේ විදුහල්පතිවරුන් ස්ථානගත කිරීමටද තමන්ට අනුමැතිය ලබාදුන් බවයි. එය නිවැරදි කරුණු දැක්වීමක් නොවන අතර, I වන ශ්‍රේණියේ විදුහල්පතිවරු ස්ථානගත කිරීම වෙනම කාර්යවන අතර ඒ සඳහා අනුමැතියක් ලබාගෙන හෝ ලබා දී නොමැති බව නිරීක්ෂණය වේ.

ඒ සම්බන්ධව තොරතුරු ලබාදීම පමණක් 2 වන වගඋත්තරකාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදුකර ඇති අතර, ඒ සඳහා අනුමැතියක් ලැබී නොමැත. 2016.01.06 වන දින කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අධ්‍යාපන ලේකම් වෙත යවන ලද "I වන ශ්‍රේණියේ විදුහල්පතිවරුන්ට සුදුසු පාසල් දීම" යටතේ පැමිණිලිකරු අම්/ කාවන්තිස්ස විද්‍යාලයෙන් පරගහකැලේ විද්‍යාලය වෙත ස්ථාන මාරුකර බී.ආර් අබේරත්න මහතා අම්/ කාවන්තිස්ස විද්‍යාලයට ස්ථාන මාරු කරන ලෙස නිර්දේශ කර ඇති අතර, එතෙක් කිසිදු අවස්ථාවක අධ්‍යාපන ලේකම් විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අනුමැතියක් ලබා දී නොමැති බවද නිරීක්ෂණය වේ. එසේ තිබියදී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අනුමැතියක් ලැබුනේ යැයි සඳහන් කරමින් අදාළ ස්ථාන මාරු කිරීම සිදුකර ඇති බව අනාවරණය වේ.

I වන ශ්‍රේණියේ විදුහල්පතිවරුන් සඳහා නිර්දේශ කරන ලද සම්මුඛ පරීක්ෂණයක්ද නොමැතිව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින්ම අදාළ පත්කිරීම සිදුකර ඇති බව මේ අනුව අනාවරණය වේ. ඒ අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදුකර ඇති I වන ශ්‍රේණියේ විදුහල්පතිවරු ස්ථානගත කිරීම වසර 05කට වැඩි සේවා කාලයක් ඇති විදුහල්පතිවරු මාරුකිරීම හා පොදු ස්ථාන මාරු කිරීමේ ආකාරය ඉතාමත්ම අවිධිමත් බව අනාවරණය වේ.

2004.09.07දරණ උතුරු නැගෙනහිර පළාත් අධ්‍යාපන ලේකම්ගේ චක්‍රලේඛය පිළිබඳව අවධානය යොමු නොකළ බව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 2016.07.22 දිනැතිව දන්වා ඇත. එමෙන්ම 2016.07.15 දිනැති මුල් පරීක්ෂණයේදි අධ්‍යාපන ලේකම්වරයාගේ නියෝජ්‍ය සහකාර ලේකම්වරයා දන්වා ඇත්තේ විදුහල්පතිවරු මාරු කිරිම සඳහා ස්ථිර ක්‍රමවේදයක් නොමැති බවයි. එහෙත් අදාළ චක්‍රලේඛය මෙතෙක් අවලංගු කර නොමැති අතර, ඒ අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ විදුහල්පතිවරු ස්ථානගත කිරිම හා මාරුකිරීමේ බලය පිළිබඳ වූ ගැටළු රාශියක් පැනනැඟී ඇති බව අනාවරණය වේ. විශේෂයෙන්ම 1 AB හා 1 C පාසල් සඳහා විදුහල්පතිවරු පත්කිරිම හා මාරු කිරීමේ බලතල අධ්‍යාපන ලේකම් සතු වන බව අධ්‍යාපන ලේකම් විසින්ම දෙවන වගඋත්තර පාර්ශවය වෙත දන්වා තිබියදී, එකී බලතල ඉක්මවා කටයුතු කර ඇති බව අනාවරණය වේ. එමෙන්ම උක්ත චක්‍රලේඛය පරිදි විදුහල්පතිවරුන් ස්ථාන මාරු වසර මැද හෝ මුල්භාගයේදී නොකළ යුතු වන නමුත් එම චක්‍රලේඛය උල්ලංඝනය කරමින් වගඋත්තර පාර්ශවය කටයුතු කර ඇති බව අනාවරණය වේ. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා එය සාධාරණීකරණය කරමින් සඳහන් කර ඇත්තේ, ලේකම්වරයා විසින් වසර මැදදී මාරුවීම් ලේඛනය අනුමත කළ නිසා එය සිදුවී ඇති බවයි.

නැගෙනහිර පළාතේ සිංහල පාසල්වල විදුහල්පති පුරප්පාඩු සඳහා අධ්‍යාපන ලේකම් විසින් 2016.02.10 දිනැතිව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත උපදෙස් දි ඇති අතර, ඒ අනුව අම්පාර කලාපයේ විදුහල්පති පුරප්පාඩු පාසල් කිහිපයක් සඳහන් කර ඇති බවත්, අම්/කාවන්තිස්ස විද්‍යාලය එයට ඇතුළත් වී නොමැති බවත්, පැමිණිලිකරු 2016.06.25 වන දින කොමිෂන් සභාවට ගොනුකළ ලිඛිත කරුණුවල දක්වන පරිදි වාර්ෂික ස්ථාන මාරු සඳහා පැමිණිලිකරු ඉල්ලුම් කර නොමැති නමුත් ඔහුද 2016.03.17 වන දින සම්මුඛ පරීක්ෂණයකට කැඳවා ඇති බව අනාවරණය වේ. විදුහල්පතිවරු ස්ථාන මාරු කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන්නේ කුමන හේතුවක් නිසාද යන්න පැහැදිලි නොමැති අතර, පැමිණිලිකරුගේ සේවාකාලය වසර 04 ක්වත් සම්පූර්ණ වී නොතිබූ හෙයින් ඔහු අදාළ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් නොවූ බව දන්වා ඇත.

එමෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ 2004.09.07 දිනැති චක්‍රලේඛනයේ සුදුසුකම් අනුව 1-C පාසලක් සඳහා විදුහල්පති II ශ්‍රේණියේ නිලධාරීන්ද සුදුසුකම් ලබන අතර අම්පාර කලාපයේ බොහෝ 1 C පාසල් වල සේවය කරන විදුහල්පති II ශ්‍රේණියේ හෝ III ශ්‍රේණියේ විදුහල්පතිවරුන් 1 AB පාසල් සඳහාද ස්ථාන මාරු කිරීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා නිර්දේශ කර ඇති බව අනාවරණය වේ.

I ශ්‍රේණියේ විදුහල්පතිවරුන්ට සුදුසු පාසල් ලබා දීමේ වැඩපිළිවෙල අනුව අදාළ පාසල් වලට ඔවුන්ගේ සේවයේ අවශ්‍යතාවය සැළකිල්ලට ගත යුතු අතර වගඋත්තර පාර්ශවය විසින් I ශ්‍රේණියේ විදුහල්පතිවරුන්ට තමන්ට කැමැති පාසලක රැඳී සිටීමට ඉඩ ලබා දී ඇති බව 2016.01.06 දිනැති කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වාර්තාව මඟින්ම තහවුරු කර ඇත. අම්/කාවන්තිස්ස විද්‍යාලයට පත්කර ඇති I ශ්‍රේණියේ විදුහල්පතිවරයාගේ ඉල්ලීම හා මාරුවී යාමට කැමැති පාසල් 5 ක ප්‍රමුඛතාවය අනුව

ඔහුගේ 4 වන ප්‍රමුඛතාවය මත එම පාසල ලබා දුන් බව වගඋත්තර පාර්ශවය තහවුරු කරන අතර ඒ අනුව I ශ්‍රේණියේවිදුහල්පතිවරුන්ට සුදුසු පාසල් නොව තමන්ට කැමැති පාසල් ලබාදීමට වගඋත්තර පාර්ශවය ක්‍රියාකර ඇති බව අනාවරණය වේ. ඒ අනුව සුදුසු පාසල් වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය යම් පාසලක් වර්ගීකරණය කරන නිර්ණායකයන් හා ඒ අනුව එකී පාසල් නඟා සිටුවීමේ අපේක්ෂිත අරමුණු බිඳ වැටෙන බව පෙනී යයි.

එමෙන්ම වගඋත්තර පාර්ශවය විසින් I ශ්‍රේණියේ විදුහල්පතිවරුන් සුදුසු පාසල් වල ස්ථානගත කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමක් සිදුකර නැති අතර, සම්මුඛ පරීක්ෂණ නොමැතිව සිදුකරන ස්ථානමාරු හා පත්වීම් වල නීත්‍යානුකූලභාවය පිළිබඳව ගැටළු වේ. වගඋත්තර පාර්ශවය විසින් අම්/වැරැන්කැටගොඩ විද්‍යාලයේ විදුහල්පති පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවා සමුමුඛ පරීක්ෂණයක්ද පවත්වා ඇති අතර I ශ්‍රේණියේ විදුහල්පතිවරුන් ස්ථානගත කිරීම සඳහාද එය අවශ්‍ය බව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාද දන්වා ඇති බව අනාවරණය වේ.

සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේදී අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද හා වෙනත් නොයෙක් නිර්ණායකයන් අනුව සුදුසුකම් පරීක්ෂා කරන අතර ඉන් වඩාත් සුදුස්සන් තෝරා ගනී. එසේ සිදු නොවුනහොත් වඩාත් සුදුසු අය අදාළ තොරතුරු සඳහා පත්නොවීමට පුළුවන. ඊට පෙර නැගෙනහිර අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මහඔය කලාපයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණ වලදී ඇතැම් අපේක්ෂකයින්ට පෞර්ෂත්වය සඳහා ලකුණු 0 ක් ලබා දීමෙන් ඔවුන්ව අදාළ තනතුරු වලට ගැනීම අවහිර කර තිබූ අතර ඒ අනුව සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම අත්‍යාවශ්‍ය වේ.

පැමිණිලිකරු අම්/කාවන්තිස්ස විද්‍යාලයේ විදුහල්පති තනතුරට පත්කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබූ අතර මේ වන විට විදුහල්පති පුරප්පාඩු පවතින අම්/වැරැන්කැටගොඩ විද්‍යාලයේ විදුහල්පති තනතුර සඳහාද සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. එහෙත් විදුහල්පති I ශ්‍රේණියේ අය සුදුසු පාසල් සඳහා ස්ථානගත කිරීමේදී වගඋත්තර පාර්ශවයන් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේ අවශ්‍යතාවයෙන් බැහැරව ඇත.

පැමිණිලිකරු වහාම ක්‍රියාත්මක වන පරිදි දින 3 ක් ඇතුළත පරගහකැලේ මහා විද්‍යාලයට සේවා අවශ්‍යතාවය මත මාරු කර ඇති අතර ඔවුන්ට ගමන් වියදම් හෝ උපවේශණ දීමනා නොගෙවන බවද ලිපියේ දක්වා ඇත. එමෙන්ම පැමිණිලිකරු විසින් වගඋත්තර පාර්ශවය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයද සලකා බලා නොමැති අතර, රාජ්‍ය නිලධාරීන් දඬුවම් මාරුවීම් ලබාදෙන අවස්ථාවල පවා අභියාචනා ආදී සලකා බැලීම සාමාන්‍ය සම්ප්‍රදාය වන අතර පැමිණිලිකරුට එම අවස්ථාව අහිමි කර ඇති බව අනාවරණය වේ. එමෙන්ම පැමිණිලිකරු විසින් අම්/කාවන්තිස්ස විද්‍යාලයේ සේවය කිරීමේදී පාසල් සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් හෝ විනය සම්බන්ධයෙන් හෝ අකාර්යක්ෂමතාවය

සම්බන්ධයෙන් කිසියම් වූ දෝෂාරෝපණයක් හෝ අපකීර්තියකට ලක්ව නොමැති අතර ඔහු වහාම ස්ථාන මාරු කිරීමට සාධාරණ හේතුවක් අනාවරණය නොවේ.

**කොමිෂන් සභාවේ නිගමනය**

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර ඇති 2016 විදුහල්පති ස්ථාන මාරු ක්‍රියාවලිය අවිධිමත් වන අතර ඒ සඳහා දෙවන වගඋත්තර පාර්ශවය විසින් ලබා දී ඇති නිර්දේශ සඳහා විධිමත් නීත්‍යානුකූල හා ක්‍රමවත් පදනමක් නොමැති බවත් අම්පාර කලාපයේ වසර 05 ට වැඩි සේවා කාලයක් සහිත විදුහල්පතිවරුන් ස්ථානමාරු කිරීමේ ක්‍රමවේදය අවිධිමත් ආකාරයෙන් සිදුව ඇති බවත් අම්පාර කලාපයේ I ශ්‍රේණියේ විදුහල්පතිවරුන් සුදුසු පාසල් සඳහා ස්ථානගත කිරීමේ ක්‍රියාවලිය අවිධිමත් හා ක්‍රමවේදයෙන් බැහැරව සිදුව ඇති බවත් නිරීක්ෂණය වේ.

ඉහත 1, 2, 3 වගඋත්තර පාර්ශවයේ අවිධිමත් ක්‍රියාවලිය හේතුවෙන් පැමිණිලිකරු සාධාරණ හේතුවක් නොමැතිව ස්ථාන මාරුවීමකට ලක්ව ඇති අතර එම ස්ථාන මාරුව නීත්‍යානුකූලව හා යුක්ති සහගත නොවන බවද නිරීක්ෂණය වේ.

ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මෙම පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

01 අම්පාර කලාපයේ 2016 විදුහල්පති ස්ථානමාරු කිරීමේ ක්‍රියාවලිය අධ්‍යාපන චක්‍රලේඛ පරිදි මාරු මණ්ඩලයක් මඟින් විධිමත්ව සිදුකර අවශ්‍ය බවත්, පුරප්පාඩු සහිත පාසල් වර්ගීකරණය කර සුදුසුකම් පරීක්ෂා කර විදුහල්පති පත්කිරීමට කටයුතු කළ යුතු බවටත්,

02 සේවා කාලය වසර 05 ට වැඩි විදුහල්පති මාරු කිරීමේ ක්‍රමවේදය නීත්‍යානුකූලව සිදුකිරීමට කටයුතු කළ යුතු බවටත්,

03 I වන ශ්‍රේණියේ විදුහල්පතිවරුන් සම්මුඛ පරීක්ෂණ පවත්වා සුදුසු පාසල් වල ස්ථානගත කිරීමට කටයුතු කළ යුතු බවටත්,

04 අධ්‍යාපන ලේකම් විසින් 2016.06.01 වන දින එකම ලිපියකින් අනුමත කර ඇති ස්ථාන මාරු සේවා කාලය වසර 05 ඉක්මවූ නිලධාරීන්ගේ මාරුවීම්හි, I වන විදුහල්පති ශ්‍රේණියේ නිලධාරීන්ගේ ස්ථානගත කිරීම අවලංගු කිරීමට කටයුතු කළ යුතු බවටත්,

05 ඉහත ක්‍රියාවලිය නීත්‍යානුකූලව සිදුවන තෙක් පැමිණිලිකරුගේ ස්ථාන මාරුව අවලංගු කිරීමටත් කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021. 12.08 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

B/